# ශ්‍රී ලංකා වරාය අධිකාරිය

## දැන්වීමයි

මගේ අංකය:- මාසළකා / විධානො/ 04/පොදු/ග.භා.

කොළඹ වරායේ පුරප්පාඩු වී පවතින පහත සඳහන් තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති මෙම අධිකාරියේ ස්ථිර වූ සේවකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

S.L.P.A. - HRIS OFFICE
2837
04 JUN 2025
Time: ............
HUMAN RESOURCE DIVISION

තනතුර : ගබඩා භාරකරු (පුරප්පාඩු ගණන - කොළඹ 03)

වැටුප් කාණ්ඩය :- 9:3 (SNT3)
ආරම්භක වැටුප :- රු 40,240/=
වැටුප් වර්ධකය :- රු. 575 /=

දැනටමත් ඉහළ වැටුප් කාණ්ඩයන්හි සිටින අපේක්ෂකයින් තෝරා ගනු ලැබුවහොත් දැනට සිටින වැටුප් කාණ්ඩය සැලකිල්ලට ගෙන 9:2 (SNT2) හෝ 9:1 (SNT1) වැටුප් කාණ්ඩයන්හි පිහිටුවීමට සලකා බලනු ලැබේ.

යෝග්‍යතාවය :-

(අ). (i) අ:පො:ස (උ.පෙළ) විභාගයේදී එකවර විෂයයන් තුන (03) කින් සමත් වීම.

සහ

(ii) අදාළ ක්ෂේත්‍රය පිළිබඳව තුන්වන (03) මට්ටමේ ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය(NVQ 3)/ මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනය මඟින් හෝ වෙනත් පිළිගත් ආයතනයක් මඟින් නිකුත් කර ඇති අදාළ ක්ෂේත්‍රයේ ඒ හා සමාන සහතිකයක් ලබා තිබීම.

සහ

(iii) SS වැටුප් කාණ්ඩයේ වසර තුන (03) ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

හෝ

(ආ) (i) දෙවරකට නොවැඩි වාර ගණනකදී අ:පො:ස (සා.පෙළ) විභාගය භාෂාව,ගණිතය සමඟ විෂයයන් හය(06) කින් සමත්වීම /මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනය මඟින් පවත්වන වරාය කටයුතු පිළිබඳව පුහුණු පාඨමාලාව සාර්ථකව අවසන් කර තිබීම.

සහ

(ii) අදාළ ක්ෂේත්‍රය පිළිබඳව තුන්වන (03)මට්ටමේ ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය(NVQ 3)/ මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනය මඟින් හෝ වෙනත් පිළිගත් ආයතනයක් මඟින් නිකුත් කර ඇති අදාළ ක්ෂේත්‍රයේ ඒ හා සමාන සහතිකයක් ලබා තිබීම.

සහ

(iii) SS වැටුප් කාණ්ඩයේ වසර පහ (05) ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

ඇප තැබීම

පත්වීම ලබන්නා රු.5,000/= ක ඇපයක් විශ්වාස ඇප රක්ෂණයක් මඟින් තැබිය යුතු අතර, ඇප ඔප්පුව සම්බන්ධයෙන් නියමිත වාර මුදල් පත්වීම ලබන්නා විසින්ම ගෙවිය යුතුයි. මීට අමතරව පත්වීම ලබන්නා විසින් මුදලින් රු.4,000/=ක ඇපයක් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ තැන්පත් කළ යුතු වේ.

සටහන

(i) කාර්ය සාධන මට්ටම සතුටුදායක විය යුතුය.
(ii) සෑම අයදුම්කරුවෙකුම තනතුරට අදාළ වෘත්තීය දැනුම පරීක්ෂා කිරීමේ පරීක්ෂණය (ලිඛිත /ප්‍රායෝගික) සමත්විය යුතුය.
(iii) තෝරා ගනු ලබන අපේක්ෂකයන් අවශ්‍ය වුවහොත් වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබේ.
(iv) ආරක්ෂක නියාමක හා ගිනිහට තනතුරු වලට බඳවාගෙන ඇති සේවකයින් මෙම තනතුරට ඉල්ලුම් කිරීම සඳහා සුදුසුකම් ලබන්නේ ආරක්ෂක සේවයේ/ ගිනි නිවන හමුදා සේවයේ වසර පහක (05) ට වැඩි සේවා කාලයක් සපුරා ඇත්නම් පමණි.
(v) තම තනතුරෙහි ස්ථිර කර ඇති පිළිගත් විශ්ව විද්‍යාලයකින් උපාධියක් ලබාගත් උපාධිධාරීන්ට අනෙකුත් සුදුසුකම් සපුරා ඇත්නම් තම තනතුර හෝ දැනට සිටින වැටුප් කාණ්ඩය නොසලකා මෙම තනතුර සඳහා අයදුම් කළ හැක.

............02 වැනි පිටුවට

ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් දැනටමත් සම්පාදනය කර ඇති හෝ ඉදිරියේදී සම්පාදනය කරනු ලබන සියළුම නීතිරීති වලට අනුකූලව පත්වීම ලබන්නා ක්‍රියා කළ යුතුය.

තෝරාගත් අපේක්ෂකයින් ශ්‍රී ලංකා වරාය අධිකාරියට අවශ්‍යවන පරිදි දිවයිනේ ඕනෑම පෙදෙසක හෝ අධිකාරියේ ඕනෑම කොට්ඨාශයක /අංශයක සේවය කිරීමට බැඳී සිටියි.

මෙම නිවේදනය අනුව සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් සිය අයදුම්පත් ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල කොට අදාළ කොට්ඨාශ /අංශ ප්‍රධානීන් මඟින් 2025.06 16 වන දින හෝ ඊට පෙර මා වෙත ලැබෙන සේ එවිය යුතුය. අදාළ <u>අධ්‍යාපන හා වෘත්තිය සහතික වල පිටපත් අමුණා එවීම අත්‍යවශ්‍ය වන අතර එසේ නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.</u>

නියමිත දිනෙන් පසුව යොමු කරනු ලබන අයදුම්පත් ප්‍රමාදවීමට තුඩුදුන් කරුණු අදාළ කොට්ඨාශ /අංශ ප්‍රධානීන් හෝ නේවාසික කළමනාකරු විසින් සඳහන් කළයුතු අතර එසේ නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

මෙම දැන්වීමේ අවශ්‍යතාවයන්ට සෑම අයුරින්ම අදාළ නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ප්‍රධාන කළමනාකරු ( මානව සම්පත් හා පරිපාලන)

2025.05.23 දින

මානව සම්පත් හා පරිපාලන කොට්ඨාශයේ දීය.